# පුද්ගල ස්වීයත්ව වර්ධනය කෙරෙහි පවුල් සංස්ථාවේ බලපෑම පිළිබඳ සමාජ-මනෝ විද්‍යාත්මක අධ්‍යයනයක්

## (ශ්‍රී ලංකාව ආශ්‍රයෙන්)

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ දර්ශනය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

**ආර්. කේ. කරුණාතිලක**

2000 මාර්තු

## සාර සංග්‍රහය

මෙම අධ්‍යයනයෙහි එන ප්‍රථම පරිච්ඡේදය නිබන්ධයේ මාතෘකාව නිර්වචන ආශ්‍රයෙන් විග්‍රහ කිරීම සඳහා වෙන් කර ඇත. ඒ අනුව විවිධ මනෝ විද්‍යාත්මක නිර්වචන ආශ්‍රයෙන් ස්වීයත්වය යන සංකල්පය ද, සමාජ හා මානව විද්‍යා නිර්වචන ආශ්‍රයෙන් පවුල යන සංකල්පය ද විමර්ශනය කරනු ලැබේ.

දෙවන පරිච්ඡේදයෙහි ස්වීයත්ව වර්ධනය පිළිබඳ මනෝවිශ්ලේෂණවාදී න්‍යාය පිළිබඳ විග්‍රහයක් සිදු කෙරේ. මෙය ස්වීයත්වයේ සංවිධානය හා එහි සංවර්ධනය පිළිබඳ විග්‍රහයකි.

තෙවන පරිච්ඡේදයෙහි ස්වීයත්වය කෙරෙහි පවුලේ බලපෑම සඳහන් වන විවිධ ආකෘති කිහිපයක් පිළිබඳ විග්‍රහයක් සිදු කෙරේ. එහි දී සිග්මන් ෆ්‍රොයිඩ්, ඇඩ්ලර් සහ ඕල්පෝට් යන මනෝවිද්‍යාඥයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

යහපත් පවුල තුළින් යහපත් ස්වීයත්වය, දුස්සමාහිත පවුල තුළින් දුස්සමාහිත ස්වීයත්වය යන මැයෙන් හතරවන පරිච්ඡේදය හඳුන්වා ඇත. පවුල තුළ සිදු වන විවිධ ක්‍රියාකාරීත්වයන් පුද්ගල ස්වීයත්වයට බලපාන අන්දම පිළිබඳව සාකච්ඡා කිරීම ඉන් සිදු කෙරේ. බිළිඳු වියේ සිටම පුද්ගලයාගේ ස්වීයත්ව වර්ධනයට පවුලින් සිදු කෙරෙන බලපෑම එහිලා සැලකිල්ලට ගනු ලැබේ. පවුල තුළ සිදු වන සාමාන්‍ය ක්‍රියාකාරීත්වයන් හැරුණු විට, පවුල් සංස්ථාව විවිධ හැලහැප්පීම්වලට භාජනය වීම නිසා පුද්ගල ස්වීයත්වයට සිදු වන හානිය පිළිබඳව ද විග්‍රහයක් කෙරේ.

පස්වන පරිච්ඡේදයෙන් ස්වීයත්ව අක්‍රමතා හා ඒ සඳහා බලපාන සාධක පිළිබඳව ද, පුද්ගල ස්වීයත්ව අක්‍රමතාවන් කෙරෙහි ජානයන්හි බලපෑම පිළිබඳව ද සංක්ෂිප්ත විග්‍රහයක් ඉදිරිපත් කෙරේ.

හයවන පරිච්ඡේදයෙන් ස්වීයත්වය තක්සේරු කිරීමේ ප්‍රමාණය ද, ස්වීයත්වයේ අගය තක්සේරු කිරීම ද විස්තර කරනු ලැබේ. එසේම පුද්ගල ස්වීයත්ව වර්ධනය කෙරෙහි බලපානු ලබන පරිණත ස්වීයත්වයේ අත්‍යාවශ්‍ය ගුණ පිළිබඳව ද, ස්වීයත්වය අගය කිරීම හා විෂයබද්ධතාව පිළිබඳව ද සංක්ෂිප්ත විග්‍රහයක් දැක්වෙයි.

හත්වන පරිච්ඡේදයෙන් නිබන්ධයේ මූලික තේමාවට අදාළ පවුල් සබඳතා රටා දරුවන්ගේ අධ්‍යාපනයට, ස්වීයත්වයට හා සමාජයට බලපාන අන්දම පිළිබඳ විස්තර කරනු ලැබේ. එලෙසම නූතන පවුල් සංස්ථාව කෙරෙහි විශේෂයෙන් ම රූපවාහිනියෙන් ඇතිවන බලපෑම පිළිබඳ සමාජ-මනෝවිද්‍යාත්මක විග්‍රහයක් ඉදිරිපත් කෙරෙයි.

අටවන පරිච්ඡේදයෙන් නව යොවුන්විය, අපචාරයට තුඩු දෙන හේතු සහ ආගමික පසුබිම ස්වීයත්වයට බලපාන ආකාරය පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කරනු ලැබෙයි. මේ මගින් අපචාරය සහ පරිසර සාධක ස්වීයත්වයට බලපාන ආකාරය ද, නව යොවුන්විය හා දුස්සමාධානය පුද්ගලයාගේ ස්වීයත්වයට බලපාන ආකාරය ද සංක්ෂිප්ත ලෙස විග්‍රහ වෙයි.

අවසාන වශයෙන් පුද්ගල ස්වීයත්ව වර්ධනය කෙරෙහි පවුල නම් වූ මූලික සමාජ සංස්ථාව බුදු දහමින් ඇගයෙන අයුරු සමාජ-මනෝවිද්‍යාත්මක විග්‍රහයක් මගින් ඉදිරිපත් කරනු ලබයි. මෙයට හේතුව ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් සංස්ථාව හා සම්බන්ධව තම ආගම ද ඉතා ළඟින් වෙළී පවතින බැවිනි. අවසාන වශයෙන් අධ්‍යයනය සම්බන්ධයෙන් එළඹි නිගමන ද මෙහිදී ඉදිරිපත් කරනු ලැබේ.